# කොවිඩ්-19 ගෝලීය වසංගත සමයක තොරතුරු භූමිකාව

පරිවර්තිත ප්‍රකාශනය

ඩේවිඩ් කේයි | හාර්ලම් ඩිසීර් | එඩිසන් ලන්සා

FMM SRI LANKA නිදහස් මාධ්‍ය ව්‍යාපාරය சுதந்திர ஊடக இயக்கம் Free Media Movement

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

# හැඳින්වීම

## කොවිඩ්-19: ගෝලීය වසංගත සමයක තොරතුරු භූමිකාව

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය නොකඩවා අවධාරණය කරමින් සිටින කරුණක් වන්නේ තොරතුරු නිදහසේ ගලායම, ඒ සඳහා ප්‍රවේශයන් පැවතීම හා ඊට නිසි යාන්ත්‍රණයන් පවත්වාගැනීම මෙවැනි අර්බුදකාරී යුගයක මූලික අවශ්‍යතාවයක් වන බවයි. මේ සමග පල කෙරෙන ප්‍රකාශනය එම සංවාදයට අර්ථවත් එකතු කිරීමක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි.

කෝවිඩ්-19 දැඩි වසංගත තත්ත්වයට මුහුණ දිය හැක්කේ මහජන සෞඛ්‍ය සේවාවන්ට අවතීර්ණවීමට තිබෙන ඉඩ ප්‍රස්ථා මත පමණක් නොවේ. මෙම ප්‍රකාශනය විසින් අවධාරණය කරන පරිදි '**පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවන්ට ආරක්ෂා විය හැකි ආකාර පිළිබඳ නිවැරදි තොරතුරු මත ද රඳා පවතී. සෑම තැනක ම, සෑම කෙනෙකුගේ ම ප්‍රකාශනයේ නිදහසත්, සෑම ආකාරයක ම තොරතුරු සහ අදහස් සෙවීමේ, ලබාගැනීමේ සහ ලබා දීමේ අයිතියත් එයට ඇතුළත් වේ.**'

මෙය වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට, පුරවැසි මාධ්‍යවේදීන්ට, සමාජ ක්‍රියාකාරිකයින්ට මෙන්ම රාජ්‍ය බලධාරීන්ට ද ප්‍රයෝජනවත් වනු ඇතැයි විශ්වාස කරමු. එසේම පවතින අර්බුදය හමුවේ යහපත් මාධ්‍ය භාවිතයක් සඳහා වන සංවාදය මෙම ප්‍රකාශනය ඇසුරෙන් තවදුරටත් පෝෂණය වනු ඇතැයි ද අපෙක්ෂා කරමු.

ඔබට මේ සමඟ ඉදිරිපත් කරන ප්‍රකාශනය සම්පාදනය කර ඇත්තේ එක්සත් ජාතීන් වෙනුවෙන් අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහස නිරීක්ෂණය කරන අන්තර් ඇමරිකා මානව හිමිකම් කොමිසම සහ යුරෝපයේ ආරක්ෂාව සහ සම්බන්ධීකරණය උදෙසා වන සංවිධානයේ මාධ්‍ය නිදහස පිළිබඳ නියෝජිතයන් විසිනි. ඔවුන්ට අපගේ ස්තූතිය හිමිවේ.

මෙම ප්‍රකාශනය කෝවිඩ්-19 සහ ජනමාධ්‍ය සම්බන්ධයෙන් පළ කිරීමට නියමිත පත්‍රිකා මාලාවක පළමුවැන්න වේ.

**සී. දොඩාවත්ත**
කැඳවුම්කරු
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
2020 මාර්තු 31

# කොවිඩ්-19: ගෝලීය වසංගත සමයක තොරතුරු භූමිකාව

**මෙම ප්‍රකාශනය පිළියෙළ කරන ලද්දේ මතයන් දැරීමට ඇති අයිතිය සහ ප්‍රකාශනයේ නිදහස පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ විශේෂ නියෝජිත ඩේවිඩ් කේයි, යුරෝපීය ආරක්ෂාව සහ සහයෝගිතා සංවිධානයේ මාධ්‍ය නිදහස පිළිබඳ නියෝජිත හාර්ලම් ඩිසීර් සහ අන්තර් ඇමරිකානු මානව හිමිකම් සංවිධානයේ අදහස් ප්‍රකාශ කිරීම පිළිබඳ විශේෂ නියෝජිත එඩිසන් ලන්සා විසිනි.**

ජිනීවා/වොෂින්ටන්/වියනා, 2020 මාර්තු 19

කොවිඩ්-19 ආසාදනය විසින් ඇති කර වර්ධනය වෙමින් තිබෙන බාධා කිරීම හමුවේ, අදහස් ප්‍රකාශනයේ නිදහස සහ මාධ්‍ය නිදහස එක්සත් ජාතීන් වෙනුවෙන් නිරීක්ෂණය කරන අන්තර් ඇමරිකා මානව හිමිකම් කොමිසම සහ යුරෝපයේ ආරක්ෂාව සහ සම්බන්ධීකරණය උදෙසා වන සංවිධානයේ මාධ්‍ය නිදහස පිළිබඳ නියෝජිතයන් විසින් විසින් පහත දැක්වෙන නිවේදනය කරනු ලැබේ:

"කොවිඩ්-19 වසංගතය හමුවේ ලොව සෑම තැන ම ජනයා වෙතින් පළ වන දැඩි උද්වේගය සමග අපි ද සම්බන්ධ වන්නෙමු. එවැනි ආතතියක් පවතින මොහොතකදී, මානව සෞඛ්‍යය සහ මානව ජීවිත ආරක්ෂා කිරීමේ මුලෝපායන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මහජන සෞඛ්‍ය වෘත්තිකයන්ගේ සහ රජයන්ගේ ප්‍රයත්නයන්ට අපි පූර්ණ සහාය ලබාදෙන්නෙමු. මිනිසුන්ට ජීවත් වීමට තිබෙන මූලික හා අහිමි කළ නොහැකි අයිතිය අවදානමට ලක් වී තිබේ. එය ආරක්ෂා කිරීමට රජයන් සතුව විශාල වගකීමක් තිබේ.

"මානව සෞඛ්‍යය රඳාපවතින්නේ කෙළින් ම ප්‍රවේශ විය හැකි සෞඛ්‍යාරක්ෂාව මත පමණක් නොවේ. එය තර්ජනයන්ගේ ස්වභාවය සහ එයින් පුද්ගලයන්ට, ඔවුන්ගේ පවුල්වලට සහ ප්‍රජාවන්ට ආරක්ෂා විය හැකි ආකාර පිළිබඳ නිවැරදි තොරතුරු මත ද රඳා පවතී. සෑම තැනක ම, සෑම කෙනෙකුගේ ම ප්‍රකාශනයේ නිදහසත්, සෑම ආකාරයක ම තොරතුරු සහ අදහස් සෙවීමේ, ලබාගැනීමේ සහ ලබා දීමේ අයිතියත් එයට ඇතුළත් වේ. එහිදී ඒ සඳහා යොදාගන්නා වූ පෙරමුණු හා භාවිතා කරනු ලබන මාධ්‍ය කුමක් වුවත්, ඒ සම්බන්ධයෙන් ඇති කළ යුත්තේ ඉතා පටු සීමාකිරීම් පමණි. ඒ සම්බන්ධයෙන් අපි පහත දැක්වෙන ඉල්ලීම් කරන්නෙමු:

"පළමුව, කොරෝනා වයිරසය විසින් ඇති කර තිබෙන තර්ජනයේ ස්වභාවය පිළිබඳ සත්‍යවාදී තොරතුරු රජයන් විසින් සැපයීම අත්‍යවශ්‍ය ය. සැමට විශ්වසනීය තොරතුරු වෙත ප්‍රවේශය පහසුවෙන් ලබාගත හැකි ආකාරවලින් ලබා දීමට සෑම තැනක ම රජයන් මානව හිමිකම් නීතිය යටතේ බැඳී සිටිති. එහිදී, සීමිත අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ඇති හෝ ආබාධ සහිතබව හේතුවෙන් ප්‍රවේශය අභියෝගාත්මක වූ පුද්ගලයන් සඳහා තොරතුරු වෙත ප්‍රවේශය තහවුරු කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

"දෙවනුව, අර්බුද සමයන්හිදී අන්තර්ජාල ප්‍රවේශය ඉතා වැදගත් ය. රජයන් අන්තර්ජාල ප්‍රවේශය හිර කිරීමෙන් වැළකී සිටීම අත්‍යවශ්‍ය ය. අන්තර්ජාලය හිර කර තිබෙන මෙම තත්වයන්හිදී රජය විසින් ප්‍රමුඛ කාර්යයක් ලෙස සලකා හැකි තරම් වේගවත් සහ පුළුල් අන්තර්ජාල ප්‍රවේශය තහවුරු කළ යුතු ය. විශේෂයෙන් ම තොරතුරු වෙත ප්‍රවේශය අතිශය වැදගත් වන හදිසි අවස්ථාවකදී මහජනයා සම්බන්ධ හදිසි නීති සහ ජාතික ආරක්ෂාව මත පදනම්ව, අන්තර්ජාලය වෙත පිවිසීම සම්බන්ධයෙන් පුළුල් බාධා කිරීම් සිදු කිරීම සාධාරණීකරණය කළ නොහැකි ය.

"තුන්වනුව, තොරතුරු වෙත ප්‍රවේශය පිළිබඳ හිමිකම යන්නෙන් අදහස් වන්නේ රජයන් ජනමාධ්‍යවේදීන්ගේ කාර්යය ආරක්ෂා කිරීම පිණිස විශේෂිත ප්‍රයත්නයක් දැරිය යුතු බවයි. මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවකදී, විශේෂයෙන් ම, මහජනයාට වැදගත් තොරතුරු දැනුම් දීම සහ රජයේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම ඉලක්ක කර තිබෙන විටදී, ජනමාධ්‍යවේදය විසින් ඉතා වැදගත් කාර්යයක් සිදුකරනු ලැබේ. සියලු පුද්ගලයන්ට, විශේෂයෙන් ම ජනමාධ්‍යකරුවන්ට, තොරතුරු වෙත ප්‍රවේශය තහවුරු කිරීම සඳහා තොරතුරු දැනගැනීමේ නිදහස පිළිබඳ නීති දැඩි ලෙස ක්‍රියාත්මක කරන ලෙස අපි සියලු රජයන්ගෙන් ඉල්ලා සිටිමු.

"සිව්වනුව, වසංගත පිළිබඳ වැරදි තොරතුරු හේතුවෙන් සෞඛ්‍ය ගැටලු, කලබල සහ කැළඹීම් ඇති වීමට තිබෙන ඉඩකඩ පිළිබඳ මහජන උද්වේගය අපි ද බෙදාහදා ගන්නෙමු. මේ සම්බන්ධයෙන් ගත් කල, රජයන් සහ අන්තර්ජාල සමාගම් විසින් පළමු අවස්ථාවේ ම තමන් විසින් ම විශ්වසනීය තොරතුරු සැපයීම මගින් දුස් තොරතුරු දුරලීම අත්‍යවශ්‍ය ය. එය ශක්තිමත් මහජන පණිවුඩ මගින්, රාජ්‍ය සේවයට සහාය ලබාදෙන නිවේදන මගින් සහ මහජන විකාශන සහ ප්‍රාදේශීය ජනමාධ්‍යවේදය සඳහා හදිසි සහාය මගින් (නිදසුනක් ලෙස, රජයේ සෞඛ්‍ය පණිවුඩ මගින්) සිදු කළ හැකි ය.

"අන්තර්ගතයන් ඉවත් කිරීම සහ වාරණය වැනි වෙනත් ක්‍රියාමාර්ග ගැනීම මගින් මහජන සෞඛ්‍යය සඳහා වැදගත් තොරතුරු වෙත ප්‍රවේශය සීමා වීම සිදු විය හැකි අතර එවැනි ක්‍රියාමාර්ග ගත යුත්තේ අවශ්‍යතාවට සරිලන ප්‍රමාණයේ ප්‍රමිතියට පමණි. වසංගතය හා සම්බන්ධ තොරතුරු වෙනුවෙන් වරදකරුවන් බවට පත් කිරීමේ ඕනෑම ප්‍රයත්නයක් මගින්

ආයතනික තොරතුරු පිළිබඳ අවිශ්වාසය ඇති කරනු ලැබේ. විශ්වසනීය තොරතුරු වෙත ප්‍රවේශය පමා කරනු ලැබේ. ප්‍රකාශනයේ නිදහසට තර්ජන ඇති කරනු ලැබේ.

"පස්වනුව, කොරෝනා වයිරසය පැතිරීම ග්‍රහණය කරගැනීම ආවේක්ෂණය කිරීම සඳහා වන තාක්ෂණික මෙවලම් භාවිතයේ වැඩි වීම පිළිබඳ අප දැනුවත් ය. ආපදාව සමග සටන් කිරීමේ සක්‍රිය ප්‍රයත්නයන්වලට සහාය දීමේ අවශ්‍යතාව අපි තේරුම් ගන්නෙමු. ඒ අතර ම, එවැනි මෙවලම් එහි අරමුණ හා අදාළ කාලය සඳහා පමණක් සීමා කිරීම ද ඉතා වැදගත් ය. පෞද්ගලිකත්වයට, වෙනස්කම් නොකිරීමට, ජනමාධ්‍ය මූලාශ්‍ර ආරක්ෂා කිරීමට සහ වෙනත් ආකාරවල නිදහස සඳහා තිබෙන පුද්ගල අයිතිවාසිකම් දැඩි ලෙස ආරක්ෂා කළ යුතු ය. රාජ්‍යයන් විසින් රෝගීන්ගේ පෞද්ගලික තොරතුරු රැකගත යුතු ය. එවැනි තාක්ෂණයන් භාවිතා කිරීම දැඩි ලෙස ම ආරක්ෂාකාරී විය යුතු බව හා ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල දේශීය නීතිය යටතේ පමණක් ක්‍රියාත්මක කළ යුතු බවත් අපි දැඩි ලෙස අවධාරණය කරන්නෙමු.

"සියලු වෛද්‍ය සහ සෞඛ්‍ය සත්කාර වෘත්තිකයන්ට ස්තුති කරමින් රෝගීන්ට ප්‍රතිකාර කිරීමෙහිදී ඔවුන්ගේ කාර්යභාරය අගය කරමින් අපි මෙම සටහන සමාප්ත කරන්නෙමු."

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement


**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**

අංක 96 බර්නාඩ් සොයිසා මාවත, කොළඹ 05

කාර්යාලය: 011 288 3483

ඊ-මේල්: fmmsrilanka@gmail.com

වෙබ් අඩවි: www.fmmsrilanka.lk

මාධ්‍ය ප්‍රතිසංස්කරණ සාහිත්‍ය එකතුව: www.mediareform.lk